

# "සාර්ථක වන්නට නිසි අධ්‍යයනයක් අවශ්‍යයි"

# වාසනා වීරකෝන්

## මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

වාසනා වීරකෝන් සංගීතාචාර්යවරිය 1996 ඔස්ට්‍රේලියාවට පැමිණ කාලයක් නිහඬව සිට නැවත ඇය උගත් සංගීත ශාස්ත්‍රය බෙදා හදා දෙන්නට සැරසෙනවා. සන්නස වෙනුවෙන් ඇය සමඟ කතා බහක යෙදෙන්නට මට පසුගිය දිනෙක අවස්ථාව ලැබුණා.

**ශ්‍රීනාත්**
වාසනාගේ පාසල් කාලය ගැන මතක් කළොත්..
**වාසනා**
මම ඉගෙන ගත්තේ මහනුවර මහ මායා බාලිකා විද්‍යාලයේ. ඉන් පස්සෙ කැළණිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනයෙන් ලලිත කලාවේදී උපාධිය ලබා ගත්තා.

**ශ්‍රීනාත්**
ඔබට සංගීතය ඉගැන්වූ ආචාර්යවරු මතකද?
**වාසනා**
පාසල් කාලයේදී ගංගා පෙරේරා නවරත්න නිමල් ආරියරත්න වැනි ගුරුවර ගුරුවරියන් ගෙන් සංගීතය ඉගෙන ගත්තා. විශ්ව විද්‍යාලයේදී සංගීත් නිපුන් සනත් නන්දසිරි එස් ජී එස් ජයසේකර කෝලිත භානු දිසානායක ආචාර්යවරුන්ගෙන් සංගීතය ඉගෙන ගත්තා.

**ශ්‍රීනාත්**
විශ්ව විද්‍යාල ජීවිතය මතක් කළොත්..
**වාසනා**
මම 1990 - 91 වසර වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් ඉහළම ලකුණු ගත්තා. ඒක මට අමතක වෙන්නෙ නැහැ.

**ශ්‍රීනාත්**
විශ්ව විද්‍යාල ජීවිතයෙන් පස්සෙ...
**වාසනා**
කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ තිබුණු ගන්නොරුව කෘෂිකර්ම ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකයේ සංගීත අංශයේ වැඩ කරන්න අවස්ථාව ලැබුණා. ඒ කාලයත් මගේ ජීවිතයේ වැදගත් කාල පරිච්ඡේදයක්. ඒ මන්දයත් ජන ගායනා සහ ජන සංගීතය පිලිබඳව පර්යේෂණ කරන්නටත් පැරණි ජන ගායනා සොයා යන්නටත් මට අවස්ථාව ලැබුණා..

**ශ්‍රීනාත්**
ගීතයක් ගායනයේදී මූලිකව අවධානය යොමු කළ යුතු කාරණා මොනවාද?
**වාසනා**
ගීතයක් ගායනා කිරීමේදී මූලික වෙන්නෙ නියමිත ස්වර වල පිහිටා ගායනා කිරීම. ශ්‍රැතිය සහ තාලය හරියට තියාගෙන ගායනා කිරීමට තමයි මූලික අවධානය යොමු කරන්න ඕනෙ.  සමහර අයට උත්පත්තියෙන්ම ගායනා හැකියාවක් ලැබෙනවා. ඒ අයට ගීත ගායනා කරන්නට පුලුවන්.  නමුත් සංගීතය ඉගෙනගත් කෙනෙක් ගායනා කරන විට ඒ වෙනස හොඳට පේනවා. ශ්‍රැතියේ පිහිටා ගායනා කරන්න පුලුවන් ඕනෑම කෙනෙකුට සරළ ගීයක් ගායනා කරන්න පුලුවන්. නමුත් ශාස්ත්‍රීය ගීයක් ගායනා කරන්න නම් සංගීතය හදාරන්න ඕනෙ. එයින් මා අදහස් කරන්නෙ නෑ සංගීතය ඉගෙනගත්තෙ නැති ගෙනෙකුට ශාස්ත්‍රීය ගී ගායනා කරන්න බැහැ කියලා. නමුත් හරියට අහන කෙනෙකුට ඒ වෙනස වටහා ගන්න පුලුවන්.

**ශ්‍රීනාත්**
සහජ හැකියාවෙන් ගීත ගායනා කරන කෙනෙකුට සාර්ථක ගායකයෙක් වෙන්න බැරිද?
**වාසනා**
පුලුවන්.  නමුත් ඒ අය හරියට සංගීතය ඉගෙන ගත්තොත් ඒ අයගේ ගමන ඉතා සාර්ථක වෙනවා. මං මෙහෙම කිව්වම ඔබ එකඟ නොවෙන්න පුලුවන්. නමුත් සත්‍යය එයයි.



**ශ්‍රීනාත්**
සංගීතය ඉගෙන නොගත් ප්‍රවීණ ගායක ගායිකාවන් ගොඩක් ඉන්නවා නේද?
**වාසනා**
මං මුලිනුත් කිව්වෙ. ඉන්නවා. නමුත් ඒ අය සංගීතය ඉගෙන ගත්තා නම් ඒ අයගෙ දක්ෂකම් තවත් ඉහළින් කැපිලා පේනවා නිසැකයි.

**ශ්‍රීනාත්**
සංගීතය ඉගෙනගන්න වයස් බේදයක් බලපානවා ද?
**වාසනා**
වයස් බේදයක් බලපාන්නෙ නෑ. නමුත් කුඩා කාලයේ සිටම ඉගෙන ගන්නවා නම් එය හරියට කළ හැකියි. මට අත්දැකීමෙන් පේනවා මගේ ළඟට සංගීතය ඉගෙන ගන්න එන කුඩා දරුවන් ඉක්මනින් සියලු ශාස්ත්‍රයන් ග්‍රහණය කරගන්නා බව. නමුත් වැඩිහිටි අයට ටිකක් කල් ගතවෙනවා. ඒක සංගීතයට විතරක් නෙවෙයි හැම විෂයකටම එහෙමයි නේද ශ්‍රීනාත්.

**ශ්‍රීනාත්**
අභ්‍යාස නොකර සංගීතය ඉගෙන ගත් පමණින් ගීත ගායනා කරන්න පුලුවන් ද?
**වාසනා**
බැහැ. අනිවාර්යයෙන්ම අභ්‍යාස වල නිරත විය යුතුයි. අධ්‍යයනය කළ යුතුයි. රඟපෑම උනත් සහජයෙන් ලැබුණත් එය අධ්‍යයනය නොකළොත් එය වර්ධනය වෙන්නෙ නෑ නේද? සංගීතයත් එහෙමයි. ප්‍රවීණ සංගීත ශිල්පීන් සෑම කෙනෙක්ම සෑමදාම අභ්‍යාස වල නිරත වෙනවා. එයට ස්ථාවර කාලයක් අවශ්‍ය වෙන්නෙ නැහැ.

**ශ්‍රීනාත්**
ගීතයක් ශ්‍රැතියේ පිහිටා ගායනා කරනවා කියන්නෙ මොකක්ද?
**වාසනා**
හරියට ස්වර වල පිහිටා ගායනා කිරීම. වාද්‍ය භාණ්ඩයක් ඇතුව හෝ නැතුව ස්වර හරියට පිහිටවා ගයනවා කියන එක තමයි ශ්‍රැතියේ පිහිටා ගායනා කිරීම කියන්නෙ. හැම ස්වරයකටම නියමිත සංඛ්‍යාතයක් තියෙනවා. ඒ සංඛ්‍යාතය කටහඬින් මතුකළ යුතුයි.

**ශ්‍රීනාත්**
ඔබේ සංගීත වැඩ වලට ඔබට සහය දෙන්නෙ කව්ද?
**වාසනා**
මගේ සැමියා නාලක වීරකෝන් පුතා ශෝන් හා දුව ෂෙහාරා නෙත්මි ගෙන් ලැබෙන සහයෝගය මට ලොකු ශක්තියක්. නාලකත් සංගීතට ඉතා ලැදි අයෙක් වීම මට ලොකු සතුටක්.

**ශ්‍රීනාත්**
ඔබ ඉගෙනගත් සංගීත ශාස්ත්‍රයෙන් අපේ සමාජයේ සංගීතය ගැන උනන්දුවක් දක්වන අයට යම් ප්‍රයෝජනයක් අත් කර දෙන්න හිතන්නෙ නැද්ද?
**වාසනා**
මගේ හිතවතුන් දැඩි ලෙස මගෙන් ඉල්ලා සිටියා ඒ අය වෙනුවෙන් යමක් කරන්නය කියලා. මං ඒ ගැන අවධානය යොමු කළා. ඒ අනුව ශාස්ත්‍රානුකූලව උත්තර භාරතීය හා ජන සංගීතය ඉගෙන ගන්නට කැමති අය වෙනුවෙන් මම සංගීත පාඨමාලාවක් ආරම්භ කළා. මං මගේ සංගීතායතනය නම් කළේ සංඛ පද්ම නමින්.

**ශ්‍රීනාත්**
ඒ ආරංචිය සංගීතය ඉගෙනගන්න කැමති අයට ඉතාමත් වැදගත් වේවි. ඔබේ අනාගත බලාපොරොත්තුව කුමක් ද?
**වාසනා**
මගේ අනාගත බලාපොරොත්තුව තමයි සංගීතයට ගායනයට ලැදි සියලු දෙනාට මා උගත් ශාස්ත්‍රය බෙදා දීම.

**ශ්‍රීනාත්**
සංගීතය මුල සිට ඉගෙනගන්නට බලාපොරොත්තු වන සැම දෙනාටම මෙය හොඳ ආරංචියක් වේවි. ඔබේ ඉදිරි බලාපොරොත්තු තව තවත් සාර්ථක වේවායි මම සන්නස වෙනුවෙන් සුබපතනවා.

ඔස්ට්‍රේලියාවේ පුවත්පතක කොටස් වශයෙන් පළ වූ පළමු සිංහල නවකතාව දැන් දයාවංශ ජයකොඩි සමාගමේ පොතක් ලෙස

**ජගත් ජේ එදිරිසිංහ ලියා**
**සිතිජය නමින් පහන මාසිකයේ කොටස් වශයෙන් පළ වූ ජනප්‍රිය නවකතාව**




මිල $10
තැපෑලට $2

තැපෑලෙන් ලබා ගැනීමට
**සූරිය මාකටිං සර්විසස්**
22 Lorne Street Lalor
Vic 3075 Australia
**දුරකතන 613 9402 5380**